**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතම සෑම වර්ෂ 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් පිරිවැය රු. 5,083,432,015 ක්වූ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | මොටර් රථ වාහන වත්කම් පංතිය පමණක් 2020 වර්ෂයේදී ප්‍රත්‍යගණනය කර මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කර ඇත. ඉතිරි සියලුම වත්කම් වර්ග වලට අදාල ප්‍රත්‍යගණන අගයන් 2021 වර්ෂයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ගිණුම් පොත්වල සටහන් කර 2021 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමට නියමිතව ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතම ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කලයුතු වුවත්, සමලෝචිත වර්ෂය තුළදී මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය | ඇතැම් වාහනවල අයිතිය පවරා දී ඇති අතර වාහන කිහිපයක් පමණක් අධිකාරිය සතුව පවතී. මේ පිළිබඳ සොයා බලා මෙම ගැටළු නිරාකරණය කර දෙන ලෙස ගිණුම් අංශය විසින් අධ්‍යක්ෂ පරිපාලන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල |

| | | | |
|---|---|---|---|
| | කිරීමේදී අධිකාරියේ පවත්නා මෝටර් රථ 15 ක් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරී තිබුණි. | දැනුවත් කර ඇත. අධ්‍යක්ෂ පරිපාලන විසින් ඉහත ගැටළු නිරාකරණය කර දුන් වහාම මෙම වාහන ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව තක්සේරු කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 1,216,781,413 ක්වූ වත්කම් වර්ග 7 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වරද නිවැරදි කිරීම සඳහා අධිකාරිය විසින් 2021 වර්ෂයේදී සියළුම වත්කම් වර්ග ප්‍රත්‍යගණනයය කළ අතර නව ප්‍රත්‍යාගණන අගයන් 2021 වර්ෂයේ ගිණුම් පොත්වල ඇතුලත් කර ඇත. ඒ හේතුවෙන් මෙම දෝෂය මේ වන විට නිවැරදි වී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුලදී චීන තනාපති කාර්යාලයෙන් පරිත්‍යාග ලෙස ලැබි තිබුණු රු. 5,316,000 ක් වටිනාකමැති පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර හා 2013 හා 2014 වර්ෂවලදී Deutsche Gesellschaft Fur International Zusammehar beit (GIZ) ව්‍යාපෘතියෙන් කිලිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය වෙත ලැබී තිබුණු රු. 6,475,926 ක් වටිනාකමැති දේපල පිරියත උපකරණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම වරද 2021 වර්ෂයේදී නිවැරදි කිරීම උදෙසා 2021.10.21 දින GRN 19509 දරණ GRN එක මගින් ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගෙන මේ වන විට ගිණුම් පොත්වල ගලපා නිවැරදි කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 9 අනුව ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම් වලට අදාලව ප්‍රමාණාත්මක බලපෑම් ඇති කරවන සිදුවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කරන බව දක්වා තිබුණද 2021 වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසයන්හිදී තීන්දු ලබාදී තිබුණු නඩු 3 කට අදාළව ගෙවිය යුතුව පැවති එකතුව රු.12,942,552 ක් වූ වන්දි | අධිකාරියේ හිටපු නිලධාරීන් කිහිප දෙනෙකු විසින් අධිකාරියට විරුද්ධව පවරා තිබුණු නඩු කටයුතු සම්බන්ධයෙන් සාරාංශගත විස්තරයක් 2020 අවසාන ගිණුම් වාර්තාව තුල ගිණුම් කරණ සටහන් අංක 32 යටතේ දක්වා ඇත. ඉහත නඩු කටයුතු වලට අදාල නඩු 3 ක් වෙනුවෙන් අධිකාරිය විසින් 2021 වර්ෂයේදී රු. 12,442,152.00 ක මුදලක් වන්දි ලෙස ගෙවීම් කර ඇත. තවද මෙම නඩු තුනට අමතරව තවත් නඩුවක් සඳහා රු 50,400,00 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා ඇත. 2021 | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගෙන ඇති ගිණුම් ප්‍රතිපත්ති අනුව කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වර්ෂයේ අවසාන ගිණුම් තුල නඩු කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කිරීමට වග බලා ගැනීමට කටයුතු කරනු ඇත. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අප්‍රේල් 03 දින සිට වැඩ අවසන් කර දැනට භාවිතා කරමින් පවතින රු. 1,261,908 ක් වූ ගොඩනැගිලි ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම ගොඩනැගිලි වලට අදාල ක්ෂය වියදමද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ජ'නල් අංක 986/897/898 මඟින් 2021 දී නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගණනය කිරීම් කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී පරිගණක මෘදුකාංග හා ජාලකරණය වෙනුවෙන් දරන ලද රු. 7,950,619 ක මුදල අස්පෘශ්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට රු.6,781,722 ක් පුනරාවර්ථන වියදම් ලෙස හා රු. 1,168,897 ක් ජංගම වත්කම් යටතේ අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 6,781,722 කින් හා ජංගම වත්කම් රු. 1,168,897 කින් වැඩියෙන් ද අස්පෘශ්‍ය වත්කම් රු. 7,950,619 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙම වරද 2021 වර්ෂයේදී නිවැරදි කළ අතර ඊට අදාල ජර්නල් වවුචර අංක 908 හා 909 දරණ ජර්නලය මඟින් නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් තැබීම සිදු කල යුතුය. |
| (ඇ) | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම යටතේ සිදු කරනු ලබන "Multi Purpose Development Task Force Training Programme 100,000" ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ අරමුදල්වලින් වැය කළ රු. 12,470,721 ක් ප්‍රතිපූර්ණය කරගත හැකි ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු නොකර අදාල වියදම පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනනවල දැක්වුණි. | රැකියා ලක්ෂයේ ව්‍යාපෘතියට අදාල මුදල් ලබා දීම ප්‍රමාද වූ බැවින් රු.12, 490,921ක මුදලක් අධිකාරියේ මුදල් වලින් වැය කර තිබූ අතර අදාල මුදල් 2021 වර්ෂයේ කාර්ය සාධන බලකාය විසින් ලබා දුන් වහාම අදාල ව්‍යාපෘතිය මගින් මෙම මුදල් අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කරනු ඇත. මෙවැනි ලැබිය යුතු යම් මුදලක් වෙතොත් ඊට අදාල ප්‍රතිපාදනයන් සඳහා ගිණුම් පොත් වල වෙන් කිරීම් සිදු කිරීමට ඉදිරියේදී වගබලා ගනිමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය යටතේ පැවති කිලිනොච්චිය ජර්මානු කාර්මික පුහුණු ආයතනය අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2020 ජනවාරි මාසයේදී රත්මලාන ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා දී තිබුණද එම පවරා දීමට අදාල රු. 290,115,476 ක් වූ වත්කම් හා රු. 984,094 ක් වූ වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. තවද එම ආයතනය වෙත ජර්මන් ආධාර යටතේ ලබාදී තිබුණු පිරිවැය රු. 1,212,751,835 ක් වූ වත්කම් හා රු. 1,615,789, 921 ක් වූ හිමිකම්, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශවල ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාල වත්කම් හා වගකීම් සියල්ල ඉවත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබේ. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ලැබිය යුතු ශේෂය තුල වර්ෂ 01 සිට වර්ෂ 15 අතර අයකර නොගත් එකතුව රු. 38,289,653 ක් වූ විවධ ණයගැති ශේෂ හා වටිනාකම රු. 1,185,654 ක සේවක ණය ඇතුලත් වී තිබූ අතර මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ජංගම වත්කම් යටතේ දක්වා තිබිණි. | පිළිතුරු ලබාදී නැත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු ශේෂය තුල ඇතුළත් වර්ෂ 02 සිට වර්ෂ 13 අතර කාලපරිච්ඡේදයකට අදාළ රු. 92,720,931 ක් වූ ගෙවිය යුතු අත්තිකාරම්, තැන්පතු ශේෂ හා විවිධ ණයහිමියන් නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැති ශේෂ පොත්වලින් ලියාහැරීමට හෝ කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------- | --------------------- | -------------------- | ----------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 760 | පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව සේනපුර පුහුණු මධ්‍යස්ථානයට අයත් වර්ග 13 ක පුහුණු උපකරණ අයිතම 108 ක ඌනතාවයක් පැවති බව විගණනයේදී අනාවරණය විය. | පිලිතුරු ලබාදී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2018 ජුලි 18 දිනැති අංක 03/ 2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සිය ආයතනවලට කාර්යමණ්ඩලය බඳවාගැනීම් හා කාර්යමණ්ඩල වෙත වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැලකිය යුතු බව අවධාරණය කර තිබියදී 2018 හා 2019 වර්ෂ තුලදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරියේ බඳවාගැනීමේ පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත 47 දෙනෙකු බඳවාගෙන දීමනා ගෙවා තිබුණි. | පිලිතුරු ලබාදී නැත. | කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2017 අප්‍රේල් 20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත බඳවාගැනීම් හා උසස්වීම් පටිපාටිය | i. සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස්වීම් ලබාදීම 2013 ඔක්තෝබර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අත්හිටුවා තිබියදී කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා 2015 ජූනි 01 දින උසස්වීම් ලබාදී තිබුණි.එම තනතුරු බලාත්මක නොවන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2016 දෙසැම්බර් 22 දින අධිකාරිය වෙත දැනුම් දී තිබුණද 2022 මාර්තු 15 දින දක්වාම එම තනතුරු අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි. විගණනය විසින් මෙම කරුණු පෙන්වා දී වසර 1 1/2 කට ආසන්න කාලයක් ගත වී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිලිතුරු ලබාදී නැත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන් තුවේ උපදෙස් අනුව එම වැරදි පත්වීම් ලබාදී තිබුණු තනතුරු අහෝසි කල යුතුය. |

ii. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු බලාත්මක නොවන බව දක්වා තිබියදී හා බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ නොකල නිලධාරීන් 02 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ තනතුරු ලබාදී තිබුණු අතර එක් නිලධාරියෙකුට 2019 ජූලි 01 දින සිට විගණන දිනය වූ 2022 මාර්තු 15 දින දක්වාම අධ්‍යක්ෂ (පුහුණු) තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 43,708,450 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 187,171,008 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 143,462,546 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අනෙකුත් පුහුණු වියදම්, සේවක පිරිවැය හා කාර්යාල පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඔරුගොඩවත්ත මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 2020 වර්ෂය සඳහා පූර්ණකාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවාගැනීමේ විවෘත තරඟ විභාගයේදී ආධුනිකයින් තෝරා ගැනීමේ කටයුතු වංචනික අයුරින් සිදුකිරිම හේතුවෙන් සුදුසුකම් ලබා තිබුණු ආධුනිකයින් 30 දෙනෙකු සිටියදී සුදුසුකම් නොලැබූ ආධුනිකයින් 20 දෙනෙකු තෝරාගෙන තිබුණි. මෙම කරුණු විගණනය විසින් පෙන්වා දී වසර 2 කට ආසන්න කාලයක් ගත වී තිබුණද අක්‍රමිකතා සිදුකල නිලධාරීන් සම්බන්ධයෙන් 2022 මාර්තු 15 දින දක්වාම කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විනිවිදභාවයෙන් යුතුව තරඟ විභාග ප්‍රතිඵල මත ආධුනිකයන් තෝරාගැනීම සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කෙරෙන 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩ සටහනෙහි පළමු පියවර යටතේ 2019 වර්ෂයට අදාලව බඳවාගත් සිසුන් 186 දෙනෙකු වෙනුවෙන් රු. 2,170,814 ක් වැයකර පුහුණුව සම්පූර්ණ කරන ලද පුහුණුලාභීන් 20 දෙනෙකුට පමණක් සහතිකපත් ලබා දී තිබුණි. | පිලිතුරු ලබා දී නැත. | අදාල ව්‍යාපෘතියේ අරමුණට ළඟා වීම සඳහා ප්‍රමාණවත් සහතික ප්‍රමාණයන් ලබාදීමට කටයුතු කල යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|---|
| (අ) | 2007 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 8,732,754 ක අධිභාර මුදල හා ගෙවිය යුතු හිඟ සේවක අර්ථසාධක අරමුදලේ සේවකයන්ගෙන් අයකල යුතු දායක මුදල වූ රු. 58,908,280 ක් අදාල නිලධාරින්ගේ අයකර ගැනීම වෙනුවට අධිකාරියේ ඉකුත් වර්ෂයේ ලාභයෙන් හා සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් අඩුකර තිබුණි. | මෙම මුදල සේවකයන්ගෙන් අයකර ගැනීමට යාමේදී ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදු විය.<br>මෙම ගැටළු නිසා මෙම මුදල සේවකයන්ගෙන් නැවත අයකර ගැනීම දුෂ්කර වූ අතර අධිකාරියට ලද ප්‍රතිපාදන මගින් මෙම මුදල ගෙවා දමන ලෙස අවසානයේ තීරණය විය. | නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් මෙම ගෙවීම කිරීමට සිදු වී තිබුණි. එබැවින් එයට වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ආයුධ ගබඩාවේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනය 2011 වර්ෂයේ දී අස්ථානගත වී තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබූ අතර දැනට ගබඩාව තුල පවතින භාණ්ඩ /උපකරණ නිවැරදිව හඳුනාගෙන විධිමත් අනුමැතියට යටත්ව නව ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගැනීමට හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනය අස්ථානගත වීමට හේතු සොයා බැලීමට කටයුතු කර නොතිබුණි. | පිලිතුරු ලබාදී නැත. | දැනට ගබඩාව තුල පවතින භාණ්ඩ /උපකරණ නිවැරදිව හඳුනාගෙන විධිමත් අනුමැතියට යටත්ව නව ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගැනීමට හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනය අස්ථානගත වීමට හේතු සොයා බැලීමට කටයුතු කල යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ආධුනිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන ලීබඩු අලෙවි කිරීමේ අරමුණින් 2014 සිට 2016 කාලපරිච්ඡේදය තුල රු. 18,847,771 ක් වැයකර ආයතන භූමියේ ඉදිකර තිබුණු ප්‍රදර්ශනාගාරය හා ඔරුගොඩවත්ත මෝටර්රථ කාර්මික ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ රු. 9,172,400 ක් වැයකර 2019 දෙසැම්බර් මාසයේ ඉදිකිරීම් නිමකර තිබුණු ශිෂ්‍ය නේවාසිකාගාරය හා කාර්යමණ්ඩල නේවාසිකාගාරය උපකරණ සමඟම විගණිත දිනය වූ 2022 මාර්තු 15 දින දක්වාම භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | දීර්ඝ කාලීනව නිෂ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල 2012 වර්ෂයේදී වසා දමා ඇති පුහුණු මධ්‍යස්ථානයක පුහුණු උපකරණ 297 ක් වසර 07 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | දීර්ඝ කාලීනව නිෂ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |